ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

| 11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය - I | කාලය: පැය තුනයි. |
|---|---|---|

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## I කොටස

**උපදෙස් :**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකය සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

01. රාජ්‍ය කැමැත්ත හා මහජන අපේක්ෂා ක්‍රියාවට නංවන නියෝජිතයා ලෙස සැලකෙන්නේ,
    1. ජනාධිපතිවරයා ය.
    2. ආණ්ඩුවයි.
    3. කථානායකවරයා ය.
    4. අග්‍රාමාත්‍යවරයා ය.

02. මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය මූලික දේවල් හැඳින්වෙන නම කුමක් ද?
    1. වුවමනා
    2. අවශ්‍යතා
    3. නිෂ්පාදන
    4. භාණ්ඩ හා සේවා

03. අජෛව සංරචක යුගලයක් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
    1. වායුගෝලය, පස
    2. දේශගුණය, ශාක
    3. මිනිසා, පස
    4. පාෂාණ, ක්ෂුද්‍ර ජීවීන්

04. ළමා අයිතිවාසිකම් පිළිබඳව සම්මුතියට අදාළ මූලධර්මයක් වන්නේ මින් කුමක් ද?
    1. ළමයාගේ නිදහස ආරක්ෂා කිරීම.
    2. ළමයාගේ උපරිම යහපත සැලසීම.
    3. ළමයාගේ අධ්‍යාපන සහතික කිරීම.
    4. ළමයාගේ සෞඛ්‍ය ආරක්ෂාව සහතික කිරීම.

05. සප්තා (SAPTA) සහ සෆ්තා (SAFTA) වෙළෙඳ ගිවිසුම ඇති කර ගන්නා ලද්දේ පහත සඳහන් කවර සංවිධානයක සාමාජික රටවල් අතර ද?
    1. සාර්ක් සංවිධානය
    2. ආසියාන් සංවිධානය
    3. බිම්ස්ටෙක් සංවිධානය
    4. යුරෝපා සංගමය

06. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ,
    1. ඔම්බුඩ්ස්මන්වරයා ය.
    2. නීතිපතිවරයා ය.
    3. අග විනිසුරුවරයා ය.
    4. අධිකරණ ඇමතිවරයා ය.

07. සන්ධීය රාජ්‍යයක බලය බෙදා හැරීම සිදුවන්නේ,
    1. ජනාධිපති හා මධ්‍යම ආණ්ඩුව අතර ය.
    2. ජනාධිපති හා ප්‍රාන්ත ආණ්ඩු අතර ය.
    3. මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය ඒකක වෙත
    4. මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩුකාරවරයා අතර ය.

08. වාර්ගික, ආගමික, කුල, ගෝත්‍ර අතර විවිධ පරස්පරතා, මත භේද නිසා ඇති ගැටුම් අයත් වන්නේ,
1. පුද්ගල ගැටුම් 2. පුද්ගල කණ්ඩායම් අතර ගැටුම්
3. පවුල් ගැටුම් 4. රටවල් කිහිපයක් අතර ගැටුම්

09. යහපාලනයක් සහිත රටක මූලික ගුණාංගයක් නොවන්නේ මින් කුමක් ද?
1. ව්‍යවස්ථානුකූලවාදය ආරක්ෂා නොකිරීම. 2. නිදහස හා සාධාරණත්වය තහවුරු කි
3. මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම. 4. අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කි

10. ශ්‍රී ලංකාවේ සබරගමුව පළාතට අයත් දිස්ත්‍රික්ක වනුයේ,
1. රත්නපුර, කෑගල්ල 2. රත්නපුර, මොණරාගල
3. කෑගල්ල, කළුතර 4. නුවරඑළිය, ගාල්ල

11. දේශගුණික වෙනස්වීම් නිසා ඇති විය හැකි අහිතකර ප්‍රතිඵලය කුමක් ද?
1. උෂ්ණත්වය ඉහළ යාම. 2. කෘෂි අස්වනු වැඩිවීම.
3. රෝග ව්‍යාප්තිය අඩු වීම. 4. මෝසම් ක්‍රියාවලියට බලපෑම් ඇති ෙ

12. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ධනාත්මක බලපෑමක් වන්නේ,
1. විදේශ ණය හා ආධාර මත යැපීමට සිදු වීමයි. 2. ආර්ථික විවිධාංගීකරණය වීමයි.
3. දේශීය ළදරු කර්මාන්තය විනාශ වීමයි. 4. බුද්ධි ගලනය වේගවත් වීමයි.

13. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්ති මගින්, ළමයෙකු වශයෙන් හඳුනා ගැනීමට හ
කරනු ලබන වයස් සීමාව කුමක් ද?
1. වයස අවුරුදු 12 ට පහළ 2. වයස අවුරුදු 15 ට පහළ
3. වයස අවුරුදු 18 ට පහළ 4. වයස අවුරුදු 19 ට පහළ

14. යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍ය 02 ඇතුළත් පිළිතුර තෝරන්න.
1. එංගලන්තය හා ඉතාලිය 2. එංගලන්තය හා ප්‍රංශය
3. ප්‍රංශය හා ඕලන්දය 4. ඕලන්දය හා ඉතාලිය

15. යුතුකම් කොටස් 02 කට බෙදේ. ඉන් එකක් සදාචාරාත්මක යුතුකමක් ලෙස සැලකේ. අනෙක් යුතුක
කොටස වන්නේ,
1. පුරවැසි යුතුකම 2. නීතිමය යුතුකම 3. සාමාජීය යුතුකම 4. ආගමික

16. 1967 දී ඉන්දුනීසියාවේ ජකාර්තා නුවර දී ආරම්භ කළ සංවිධානය වනුයේ,
1. සාර්ක් 2. ආසියාන්
3. කොළඹ ක්‍රමය 4. බිම්ස්ටෙක් සංවිධානය

17. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අවසාන හා ඉහළම අභියාචනා අධිකරණය ලෙස ක්‍රියාත්මක වැ
1. අභියාචනාධිකරණයයි. 2. දිසා අධිකරණයයි.
3. මහාධිකරණයයි. 4. ශ්‍රේෂ්ඨාධිකරණයයි.

18. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරාදීම යනු,
1. බලය පවරා දීම. 2. බලය බෙදීමයි.
3. බලය විමධ්‍යගත කිරීම. 4. බලය නියාමනය කිරීමයි.


19. මහනගර සභාවක ප්‍රධානියා වන්නේ,
1. පුරපත් 2. සභාපති 3. කථානායකතුමා 4. අගමැති

20. බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංගයක් නොවන්නේ

1. අන්‍යය සංස්කෘතීන්ට ගරු කිරීම.
2. සර්ව ආගමික වැඩසටහන් නොකිරීම.
3. සමානාත්මතාවය.
4. අන්‍ය මත ඉවසීම.

21. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මුල්වරට ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් වැදගත් අංගයක් වන්නේ,

1. අග්‍රාණ්ඩුකාර ධුරයයි.
2. විධායක ජනාධිපති ක්‍රමයයි.
3. ව්‍යවස්ථාදායක සභාවයි.
4. මැතිවරණ කොමිෂන් සභාවයි.

22. 


ජොහාන් ගැල්ටුන් විසින් ඉදිරිපත් කළ ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියේ, A, B, C පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

1. චර්යාව, සන්දර්භය, ආකල්ප
2. චර්යාව, ආකල්ප, විශ්වාස
3. පරිසරය, ආකල්ප, පුරුදු
4. සබඳතා, පරිසරය, පුරුදු

23. රාජ්‍යයක් තුළ දක්නට ලැබෙන මූලික ලක්ෂණ නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

1. භූමිය, ජනගහනය, අධිකාරිබලය, නීතිය
2. භූමිය, ජනගහනය, ආණ්ඩුව, නීතිය
3. භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපතිබලය
4. භූමිය, ආණ්ඩුව, නීතිය, අධිකාරිබලය

24. "දේශ සීමා" නම් සාධකය පදනම් කරගෙන ගැටුම් නිර්මාණය වී ඇති රාජ්‍යයක් වන්නේ,

1. අයර්ලන්තය - ඉතියෝපියාව
2. සිරියාවයි - සොමාලියාව
3. ඉන්දියාව - චීනය
4. ඊශ්‍රායලය - පලස්තීනය

25. "දැනුම, ඇදහිලි, කලා, නීති, සිරිත් විරිත් අගයන් හා මිනිසා විසින් සමාජීය පුද්ගලයෙකු ලෙස ලබා ගන්න පුරුදු ඇබ්බැහිකම හා හැකියාවන්ගේ සමස්තය"

1. සමාජ ක්‍රම වේ.
2. සංස්කෘතිය වේ.
3. යහපුරුදු වේ.
4. සම්ප්‍රදායන්

26. සෘජු ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ දී ගැටළුවක් වන්නේ,

1. නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම.
2. රාජ්‍යයක ජනගහනය අධික වීම.
3. රාජ්‍යයක විවිධ පක්ෂ පැවැත්ම.
4. පුරවැසියන්ගේ ආදායම් විෂමතාවක් පැව

27. රටක මූලික නීතිය ඇතුළත් කර ඇති ප්‍රධාන ලියවිල්ල හඳුන්වනු ලබන්නේ,

1. මානව හිමිකම් ප්‍රඥප්තියයි.
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
3. දණ්ඩ නීති සංග්‍රහය
4. මූලික අයිතිවාසිකම් ලේඛනය.

28. මරණ දඬුවම නියම වූවකුගේ එම දඬුවම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශය ජනාධිපතිවරයාට ලබාදීම කරන්නේ,

1. නීතිපතිතුමා විසිනි.
2. අග්‍රවිනිශ්චයකාරතුමා විසිනි.
3. අධිකරණ ඇමතිතුමා විසිනි.
4. ආණ්ඩුකාරවරයා විසිනි.

29. ආර්ථික නොවන භාණ්ඩයක් හා ආර්ථික භාණ්ඩයක් පිළිවෙළින් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

1. ජලය හා වාතය
2. ඖෂධ හා හිරුඑළිය
3. ජලය හා ආහාර
4. ඇඳුම් හා ආහාර

30. රාජ්‍යවල ප්‍රධාන ස්වරූප 02 වන්නේ,

1. ජනාධිපති හා පාර්ලිමේන්තු
2. ඒකීය හා සන්ධීය රාජ්‍යය
3. මධ්‍යම හා ප්‍රාදේශීය
4. ජාතික හා සන්ධීය

1. ඒකීය ආණ්ඩුක්‍රමයක් දක්නට ලැබෙන රාජ්‍ය ඇතුළත් පිළිතුර වන්නේ,
   1. ඇමරිකාව  2. බ්‍රිතාන්‍ය  3. ඕස්ට්‍රේලියාව  4. ස්විස්ටර්ලන්තය

32. දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඇමරිකා එක්සත් ජනපදය යුරෝපා රටවල් සමඟ එකතු වී පිහිටුවා ගත් සංවිධානය කුමක් ද?
   1. BIMSTEC (බිම්ස්ටෙක්)
   2. UNESCO (යුනෙස්කෝ)
   3. ASEAN (ආසියාන්)
   4. NATO (නේටෝ)

33. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට අයත් නොවන කාර්යයක් වන්නේ,
   1. අතුරු පාරවල් ඉදි කිරීමයි.
   2. ප්‍රදේශයේ පාසල් ඉදි කිරීමයි.
   3. පොදු කියවීම් ශාලා පවත්වාගෙන යාම.
   4. මහජන වැසිකිළි ඉදිකිරීම හා නඩත්තු කිරීම.

34. යම් රටක විදේශීය ශුද්ධ සාධක ආදායම සැලකිල්ලට ගැනීමෙන් පසුව වර්ෂයක් තුළ නිපදවන සියලු භාණ්ඩ හා සේවාවල වටිනාකම්වල එකතුව හඳුන්වන නම කුමක් ද?
   1. දළ ජාතික නිෂ්පාදිතය.
   2. මූල්‍ය දළ ජාතික නිෂ්පාදිතය.
   3. හරිත දළ දේශීය නිෂ්පාදිතය.
   4. මූර්ත දළ ජාතික නිෂ්පාදිතය.

35. කිසියම් රටක් රාජ්‍ය උපාය සම්බන්ධතා ගොඩනඟා ගැනීමේ දී බලපාන වැදගත්ම සාධකය වන්නේ,
   1. ගෝලීය පිහිටීම.
   2. දේශපාලන ස්ථාවරභාවය
   3. විදේශ ප්‍රතිපත්තියයි.
   4. ආර්ථික ප්‍රතිපත්තියයි.

36. දේපළ අයිතිය පෞද්ගලික අංශය සතුවීම හා ලාභය පෙරදැරි කරගෙන ආර්ථික කටයුතු සිදු කරන අර්ථ ක්‍රමය,
   1. වෙළෙඳ අර්ථ ක්‍රමයයි.
   2. ධනවාදි අර්ථ ක්‍රමයයි.
   3. මිශ්‍ර අර්ථ ක්‍රමයයි.
   4. සමාජවාදි අර්ථ ක්‍රමයයි.

37. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පනතට අයත් වන ප්‍රධාන නීතිමය ලේඛන සංඛ්‍යාව වන්නේ,
   1. 4 කි.  2. 5 කි.  3. 6 කි.  4. 7 කි.

38. පාරිසරික ගැටළු ඇතිවීමට මුල්වන ප්‍රධානතම හේතුවක් ලෙස හැඳින්විය හැකි කරුණ වන්නේ,
   1. අඩු අධ්‍යාපනය
   2. නොදැනුවත්කම
   3. සම්පත් අධිපරිභෝජනය
   4. දිළිඳුකම

39. ජාත්‍යන්තර සබඳතා වර්ධනයේ දී නූතනයේ දක්නට ලැබෙන ප්‍රවණතා ඇතුළත් පිළිතුර කුමක් ද?
   1. තාක්ෂණික, අධ්‍යාපනික හා රාජතාන්ත්‍රික සම්බන්ධතා
   2. වෙළෙඳාම, අධ්‍යාපනික හා රාජතාන්ත්‍රික සම්බන්ධතා
   3. සංස්කෘතික, රාජ්‍ය තාන්ත්‍රික හා වෙළෙඳ සබඳතා
   4. වෙළෙඳාම, සංස්කෘතික හා තාක්ෂණිකරණය

40. නිෂ්පාදන සාධක හා ඒවාට කරන ගෙවීම් නිවැරදි ව දක්නට ඇති පිළිතුර තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| 1. භූමිය | A. බදු කුලිය |
| 2. ශ්‍රමය | B. ලාභය |
| 3. ප්‍රාග්ධනය | C. පොලිය |
| 4. ව්‍යවසායකත්වය | D. වැටුප |

   1. B C A D  2. A B C D  3. A D C B  4. D A C B

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව, ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

(1). (i) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව ප්‍රධාන කොටස් 02 කි. නම් කරන්න.

(ii) මූලික ආර්ථික ප්‍රශ්න 03 කි. ඒ අතරින් 02 ක් නම් කරන්න.

(iii) පරිසරයෙන් ලැබෙන සේවා 02 ක් ලියන්න.

(iv) 1978 ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාදායක බලතල 02 ක් ලියන්න.

(v) යහපාලනයේ මූලික ගුණාංග 02 ක් ලියන්න.

(vi) ස්විට්සර්ලන්තයේ තැන්ටන් සතු බලතල 02 ක් ලියන්න.

(vii) තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ 02 ක් ලියන්න.

(viii) ගැටුම් ඇතිවන මූල 02 ක් නම් කරන්න.

(ix) සංවර්ධනය වන රටවල ලක්ෂණ 02 ක් ලියන්න.

(x) කොළඹ ක්‍රමයේ සාමාජික රටවල් 02 ක් ලියන්න.

(2). සෑම පළාත් සභාවක් සඳහා ම ආණ්ඩුකාරවරයකු සිටින අතර මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරන නියෝජිතයා වන්නේ ඔහු ය.

(i) ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්යයන් 02 ක් ලියන්න.

(ii) ස්විස්ටර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහිවීමට බලපෑ හේතු 03 ක් ලියන්න.

(iii) (a) සන්ධීය රාජ්‍යයක ලක්ෂණ 03 ක් ලියන්න.

(b) ඉන් එකක් පැහැදිලි කරන්න.

(3). සමාජයේ යහපැවැත්ම ආරක්ෂා කර ගැනීම පුරවැසියන් වන අප සැමගේ වගකීමකි.

(i) නීතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ දෙදෙනෙකු නම් කරන්න.

(ii) ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලතල 03 ක් ලියන්න.

(iii) (a) නීතියේ ගුණාංග 03 ක් ලියන්න.

(b) ඉන් එකක් පැහැදිලි කරන්න.

(4). සමාජ ක්‍රමයක් තුළ මිනිසුන් ජීවත් වීමේ දී විවිධ අවශ්‍යතා හා වුවමනා ඇති වේ.

(i) ආර්ථික ක්‍රියාවලින් ප්‍රධාන කොටස් 03 කි. ඉන් 02 ක් ලියන්න.

(ii) ධනවාදී අර්ථ ක්‍රමයක ලක්ෂණ 03 ක් ලියන්න.

(iii) (a) ගෝලීයකරණයේ විශේෂ ලක්ෂණ 03 ක් ලියන්න.

(b) ඉන් එකක් පැහැදිලි කරන්න.

(5). මානව හිමිකම් සෑම පුද්ගලයෙකුට ම, කිසිදු භේදයකින් තොරව උපතින් ම හිමිවන දෙයකි.

(i) මානව හිමිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත්වන ඓතිහාසික අවස්ථා 02 ක් ලියන්න.

(ii) මානව අයිතිවාසිකම් වර්ග 03 ක් ලියන්න.

(iii) (a) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග 03 ක් ලියන්න.

(b) ඉන් එකක් පැහැදිලි කරන්න.

(6). පරිසරය යනු, ජීවී අජීවී සංරචකවල සංකලනයකි.

(i) පරිසර පද්ධතිය සකස් වී ඇති ජෛව සංරචක 02 ක් ලියන්න.

(ii) ජල දූෂණය සිදුවන අවස්ථා 03 ක් ලියන්න.

(iii) (a) පරිසරය සම්බන්ධ පුරවැසි වගකීම් හා යුතුකම් 03 ක් ලියන්න.

(b) ඉන් එකක් පැහැදිලි කරන්න.

(7). පුද්ගල මනස තුළ නොරිස්සුම්කාරි තත්ත්වයන් මගින් ගැටුමක මූලාරම්භය සිදු වේ.

(i) ගැටුම් ඇතිවන පාර්ශව 02 ක් ලියන්න.

(ii) ගැටුමට හේතුවන කරුණු 03 ක් ලියන්න.

(iii) සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණ 03 ක් ලියන්න.

(iv) ඉන් එකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

*******

(5). මානව හිමිකම් සෑම පුද්ගලයෙකුට ම, කිසිදු භේදයකින් තොරව උපතින් ම හිමිවන දෙයකි.

(i) මානව හිමිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත්වන ඓතිහාසික අවස්ථා 02 ක් ලියන්න.

(ii) මානව අයිතිවාසිකම් වර්ග 03 ක් ලියන්න.

(iii) (a) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග 03 ක් ලියන්න.

(b) ඉන් එකක් පැහැදිලි කරන්න.

(6). පරිසරය යනු, ජීවී අජීවී සංරචකවල සංකලනයකි.

(i) පරිසර පද්ධතිය සකස් වී ඇති ජෛව සංරචක 02 ක් ලියන්න.

(ii) ජල දූෂණය සිදුවන අවස්ථා 03 ක් ලියන්න.

(iii) (a) පරිසරය සම්බන්ධ පුරවැසි වගකීම් හා යුතුකම් 03 ක් ලියන්න.

(b) ඉන් එකක් පැහැදිලි කරන්න.

(7). පුද්ගල මනස තුළ නොරිස්සුම්කාරි තත්ත්වයන් මගින් ගැටුමක මූලාරම්භය සිදු වේ.

(i) ගැටුම් ඇතිවන පාර්ශව 02 ක් ලියන්න.

(ii) ගැටුමට හේතුවන කරුණු 03 ක් ලියන්න.

(iii) සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණ 03 ක් ලියන්න.

(iv) ඉන් එකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

*******

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

| 11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය - I, II | |
|---|---|---|

## පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01. 2 | 11. 1 | 21. 2 | 31. 2 |
| 02. 2 | 12. 2 | 22. 1 | 32. 4 |
| 03. 1 | 13. 3 | 23. 3 | 33. 2 |
| 04. 2 | 14. 2 | 24. 4 | 34. 1 |
| 05. 1 | 15. 2 | 25. 2 | 35. 2 |
| 06. 2 | 16. 2 | 26. 2 | 36. 2 |
| 07. 3 | 17. 4 | 27. 2 | 37. 3 |
| 08. 2 | 18. 3 | 28. 1 | 38. 3 |
| 09. 1 | 19. 1 | 29. 3 | 39. 1 |
| 10. 1 | 20. 2 | 30. 2 | 40. 3 |

## II පත්‍රය

(1). (i) * දේශීය නීතිය * අන්තර්ජාතික නීතිය (මින් දෙකක් සඳහා ලකුණු 02)

(ii) * කුමක්, කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?
* කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද? (මින් දෙකක් සඳහා ලකුණු 02)

(iii) * ජීව උපකාරක සේවා
* ආර්ථික උපකාරක සේවා
* අපද්‍රව්‍ය අවශෝෂක සේවා (මින් දෙකක් සඳහා ලකුණු 02)

(iv) * පාර්ලිමේන්තුව කැඳවීම, වාර අවසාන කිරීම හා විසුරුවා හැරීම.
* පාර්ලිමේන්තු සැසි වාර ආරම්භයේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කිරීම.
* විශේෂ පනත් කෙටුම්පත් ජනගත විචාරණයකට යොමු කිරීම.

(මින් දෙකක් සඳහා ලකුණු 02)

(v) * දූෂණයෙන්, වංචාවෙන් තොර රාජ්‍ය පාලනය හා පරිපාලනය
* නිදහස හා සාධාරණත්වය තහවුරු කිරීම.
* නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම හා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම.
* අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම.
* මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම.
* රාජ්‍ය පාලන බලතල ක්‍රියාවට නංවන පුද්ගලයින් ජනතාවට වගකීමට බැඳී සිටීම.
* සම්පත් කාර්යක්ෂමව හා ප්‍රතිඵලදායී අයුරින් භාවිතයට ගැනීම.
* විනිවිද නාමයකින් යුතුව කටයුතු කිරීම.
* ගුණාත්මක දේශපාලන සමාජානුයෝජනයට අවශ්‍ය පසුබිම සකස් කිරීම.
* ව්‍යවස්ථානුකූලවාදය ආරක්ෂා කිරීම හා රැක ගැනීම.

(මින් දෙකක් සඳහා ලකුණු 02)

(vi) * අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය
* පුවත්පත් පාලනය
* මහාමාර්ග
* කර්මාන්ත
* ආගමන
* බෝවන රෝග වැළැක්වීම
* බැංකු කටයුතු

(මින් දෙකක් සඳහා ලකුණු 02)

(vii) * ජන මත නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම.
* අත්තනෝමතික පාලනයක් බිහිවීම වැළැක්වීම.
* ආණ්ඩු පක්ෂයේ අහිතකර ප්‍රතිපත්ති විවේචනය කිරීම තුළින් ඒවා නිවැරදි කර ගැනීමට අවස්ථාව සැලසීම.
* ජන සමාජයේ පවතින විවිධත්වය නිරූපණය වීමට අවස්ථාව සැලසීම.
* බහුවිධතාව තුළින් එක්සත් බව ගොඩනැගීම.

(මින් දෙකක් සඳහා ලකුණු 02)

(viii) * වාර්ගිකත්වය
* දේශපාලනය
* සමාජ ආර්ථික තත්ත්වය
* ආගමික මතවාද

(මින් දෙකක් සඳහා ලකුණු 02)

(ix) * ළදරු මරණ අනුපාතය ඉහළ යාම.
* භෞතික ජීවන තත්ත්ව දර්ශකය පහළය.
* ඒක පුද්ගල ආදායම පහළය.
* මානව සංවර්ධන දර්ශකය පහළය.
* විදේශ විනිමය ඉපයීම අඩුය.
* තාක්ෂණය භාවිතය අඩුය.
* එක් වෛද්‍යවරයෙකුට සිටින රෝගීන් සංඛ්‍යාව වැඩිය.
* ජන සංඛ්‍යා වර්ධන වේගය වැඩිය.

(x) * ශ්‍රී ලංකාව * නවසීලන්තය * ලාඕසය * මියන්මාරය
* ජපානය * මැලේසියාව * මාලදිවයින

(2). (i) * පළාත් සභාව කැඳවීම, වාර අවසාන කිරීම හා විසුරුවා හැරීම.
* පළාත් සභාව ඇමතීම හා සන්දේශ යැවීම.
* ප්‍රධාන ඇමතිවරයා පත් කිරීම, අමාත්‍ය මණ්ඩලය හා අනෙක් පළාත් විධායක නිලධාරීන් පත් කිරීම.
* පළාත් සභා ප්‍රඥප්තීන් අනුමත කිරීම.
* හදිසි අවස්ථාවන්හි දී ජනාධිපතිවරයාගේ උපදෙස් අනුව ක්‍රියා කිරීම.
* මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කිරීම.
* පළාත් නොවේ නාමික විධායකය වශයෙන් පළාත් මහා ඇමතිවරයාගේ උපදෙස් මත ක්‍රියා කිරීම.

(මින් දෙකක් සඳහා ලකුණු 02)

(ii) * ප්‍රංශය, ඉතාලිය, ජර්මනිය සහ ඔස්ට්‍රේලියාව යන රටවල් පහතරට මැදිම පිහිටා තිබීම හේතු කොට ගෙන ජාතික ආරක්ෂාවට තර්ජන එල්ලවීම.
* දැඩි භූගෝලීය විෂමතා හේතුවෙන් ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීමට අපහසු වීම.
* වාර්ගික භාෂා හා ආගමික විවිධත්වයට සාර්ථක විසඳුම් ලබා ගැනීම අවශ්‍ය වීම.

(ලකුණු 02)

(iii) (a) * ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවැත්වීම.
* මධ්‍යම ආණ්ඩුවේ මෙන්ම ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල පැහැදිලිව ව්‍යවස්ථාව තුළ අන්තර්ගත කිරීම.
* ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය ඉහළ අධිකරණයට පැවරීම.
* ඉහළ මන්ත්‍රණ සභාවක් (උත්තර මන්ත්‍රී මණ්ඩලයක්) ඇති කිරීම.

(මින් දෙකක් සඳහා ලකුණු 02)

(b) * සන්ධීය රාජ්‍යයක ලක්ෂණ අතරින් එකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 02)

(3). (i) * ටී.එච්.ග්‍රීන් (T.H.Green)
* ජෝන් ඔස්ටින් (John Austin) (ලකුණු 02)

(ii) * ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය.
* ජනමත විචාරණ පෙත්සම් විභාග කිරීමේ බලය.
* ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය.
* මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ පෙත්සම් විභාග කිරීමේ බලය.
* උපදේශාත්මක අධිකරණ බලය.
* පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ අධිකරණ බලය.
* රීති සැකසීමේ අධිකරණ බලය.
* අවසාන අභියාචනාධිකරණය බලය

(මින් දෙකක් සඳහා ලකුණු 03)

(iii) (a) * අධිකාරී බලය පදනම් කරගෙන රාජ්‍ය විසින්ම ........................ වීම.
* මිනිස් ක්‍රියාකාරකම් හා චර්යා පාලනය කිරීමේ අරමුණින් පනවන්නක් වීම.
* යුක්ති සහගත හා සාධාරණ විය යුතු වීම.
* පොදු සමාජ යහපත අරමුණු කොට ගෙන පැනවිය යුතු වීම.
* වෙනස්වන සමාජ අවශ්‍යතා අනුව වෙනස්වීම.
* නිරවුල්ව හා පැහැදිලිව දැක්විය යුතු වීම.
* නීති කඩ කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වීම.

(මින් දෙකක් සඳහා ලකුණු 03)

(b) නීතියේ ගුණාංග අතරින් එකක් ලියා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(4). (i) * නිෂ්පාදනය * බෙදා හැරීම * පරිභෝජනය (මින් දෙකක් සඳහා ලකුණු 02)

(ii) * තරගකාරී වෙළෙඳ පොළක් පැවතීම.
* නිෂ්පාදන සාධකවල අයිතිය පෞද්ගලික අංශය සතු වීම.
* ලාභය අරමුණු කරගෙන නිෂ්පාදනය සිදු වීම.
* ආදායම් අසමාන ලෙස බෙදී යාම.

(මින් දෙකක් සඳහා ලකුණු 03)

(iii) (a) * වැඩ ලෝකය පුළුල් වීම.
* ගෝලීය වෙළඳපොළ පුළුල් වීම.
* ලෝකයේ ඕනෑම රටක ජීවත් වීමට හැකිවීම.
* තම දක්ෂතා හා හැකියා අනුව වෙනත් රටක සේවය කිරීමට හැකිවීම.
* අඩු මිලට ශ්‍රමය ලබාගත හැකි රටවලට කර්මාන්ත සංක්‍රමණය වීම.

(මින් දෙකක් සඳහා ලකුණු 03)

(b) ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ එකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(5). (i) * ක්‍රි.ව.1215 – බ්‍රිතාන්‍යයේ මැග්නා කාර්ටා ගිවිසුම
* ක්‍රි.ව.1689 – බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත
* ක්‍රි.ව.1776 – ඇමරිකානු නිදහස් ප්‍රකාශනය
* ක්‍රි.ව.1789 – මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය
* ක්‍රි.ව.1917 – රුසියානු විප්ලවය

(මින් දෙකක් සඳහා ලකුණු 02)

(ii) * සිවිල් අයිතිවාසිකම්.
* දේශපාලන අයිතිවාසිකම්.
* ආර්ථික අයිතිවාසිකම්
* සමාජයීය අයිතිවාසිකම්
* සංස්කෘතික අයිතිවාසිකම්

(මින් දෙකක් සඳහා ලකුණු 03)

(iii) (a) * එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම.
* ළමයින් සම්බන්ධ සෑම ක්‍රියාවලියකදීම ඔවුන් පිළිබඳව ගනු ලබන සෑම තීරණයකදීම "ළමයාගේ උපරිම යහපත සැලසෙන පරිදි කටයුතු කිරීම".
* ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය කරන විට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැලකිල්ලට ගෙන නීති සම්පාදනය කිරීම.

* ළමයින් සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා පවත්වාගෙන යාම සහ බලය පැවරීම.
* පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම.
* සෑම පොලීසියකම ළමයින් හා කාන්තාවන්ට අදාළ පැමිණිලි විනාශ කිරීම සඳහා ළමා හා කාන්තා අංශයක් පිහිටුවීම.
* ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පිහටුවීම. (Child Line Sri Lanka – 1929)

(මින් දෙකක් සඳහා ලකුණු 03)

(b) කෙටියෙන් විස්තර කරන්න. (මින් දෙකක් සඳහා ලකුණු 03)

(6). (i) * සත්ත්වයින් * මිනිසා * ශාක * ක්ෂුද්‍ර ජීවින් (මින් දෙකක් සඳහා ලකුණු 02)

(ii)
* කර්මාන්ත මගින්
* කෘෂි කාර්මික කටයුතු මගින්
* ස්වාභාවික හේතු නිසා
* ගෘහස්ථ පරිභෝජනය මගින් හා කුණු කසල හා මල මගින් අපවිත්‍ර වීම.
* යාන වාහන සේදීම
* අම්ල වැසි මගින්
* ලවණ ජලය රට තුළට ගලා ඒම මගින්
* සාගරය ආශ්‍රිතව න්‍යෂ්ටික අත්හදා බැලීම් හා යුද්ධමය අභ්‍යාස මගින්

(මින් දෙකක් සඳහා ලකුණු 03)

(iii) (a)
* පාරිසරික සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය.
* නොදිරන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමෙන් වැළකීම.
* අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය
* නිවස හා අවට පරිසරයේ රුක්රෝපණ දිරිමත් කිරීම.
* පරිසරයේ පැවැත්ම හා වැදගත්කම වටහාගෙන කටයුතු කිරීම.
* පරිසරය සුරැකීම පිළිබඳ අනෙකුත් පුද්ගලයින් දැනුවත් කිරීම.
* පරිසර නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීම.
* පරිසරය සම්බන්ධව කටයුතු කරන ආයතනවල පූර්ණ අනුග්‍රහය ලබා දීම.
* සෑම විටම පරිසර හිතකාමී ජීවන ක්‍රමයක් අනුගමනය

(මින් දෙකක් සඳහා ලකුණු 03)

(b) පරිසරය සම්බන්ධ පුරවැසි යුතුකම් හා වගකීම් අතරින් එකක් ලියා කෙටියෙන් පැහැදිලි කරන්න.
(මින් දෙකක් සඳහා ලකුණු 02)

(7). (i)
* පුද්ගලයා තුළ
* පුද්ගලයින් අතර
* ජන කණ්ඩායම් අතර
* රටවල් අතර

(මින් දෙකක් සඳහා ලකුණු 02)

(ii)
* විවිධ ප්‍රතිරූප
* වෙනත් අදහස්
* සීමා ඇතිවීම
* අවහිරතා ඇතිවීම
* මානසික තත්ත්ව
* පරමාර්ථ ඉටු නොවීම

(මින් දෙකක් සඳහා ලකුණු 03)

(iii)
* සාකච්ඡාවෙන් විසඳුම් කරා යොමු වීම.
* පෞද්ගලික හෝ විශ්වසනීය මට්ටමින් සිදුවීම.
* ක්ෂණික විසඳුම් ලැබීම.
* වියදම් අවම ක්‍රමයක් වීම.
* අවධිමත් ව්‍යුහයකින් යුක්ත වීම.
* දෙපාර්ශවයටම ''ජය - ජය'' විසඳුම් ලැබීම.

(මින් දෙකක් සඳහා ලකුණු 03)

(iv) සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණ අතරින් එකක් ලියා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

*******

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**